# සැලැස්ම

| නිර්ණායක | පැහැදිලි කිරීම් | වර්ගය |
|---|---|---|
| වෙනස් වූ මාතෘකාවක් | එකම මාතෘකාවට දැනටමත් පාඨමාලා කිහිපයක් තිබේද? එසේ නම්, ඔබේ ස්ථාවරය තවදුරටත් කැපී පෙනෙන ලෙස ඔබගේ පාඨමාලාව වෙනස් කරන්න. | නිර්දේශිත |
| පාඨමාලා අරමුණු | ඔබගේ පාඨමාලාවේ 'සිසුන් ඉගෙන ගන්නේ කුමක්ද '; 'පාඨමාලාවේ ඉලක්කගත කණ්ඩායම '; 'පාඨමාලා අවශ්‍යතා '- යන අංග හිස්ව තැබිය නොහැක.<br><br>ඔබේ පාඨමාලාවට සිසුන් සඳහා වැදගත් වන්නේ මන්දැයි අවධාරණය කරන්න. සිසුන්ට අධ්‍යයනය කිරීමට හැකි මාතෘකා පමණක් නොව ඔවුන් ලබා ගන්නා නිපුණතා වෙත අවධානය යොමුකරන්න.<br><br>පාඨමාලාව සඳහා සාමාන්‍යකරණය සඳහා වන වචන භාවිතය හැකිතාක් අඩු කරන්න. (උදා :- "ඕනෑම කෙනෙකුට ", "හැමෝටම")<br><br>පාඨමාලාව වඩාත් ගැලපෙන්නේ කුමන පිරිසක් සඳහා ද යන්න සඳහන් කරන්න.<br><br>සිසුන් පාඨමාලාව ආරම්භ කිරීමට පෙර දැන ගත යුතු දේ ගැන විස්තර සැපයීම සිදු කරන්න. | අවශ්‍ය<br><br>අවශ්‍ය<br><br>අවශ්‍ය<br><br>නිර්දේශිත<br><br>නිර්දේශිත |
| ඉගැන්වීමේ ව්‍යුහය | සෑම පාඨමාලාවක් සඳහාම විෂය මාලාව පිළිබඳ හැඳින්වීමක් සහ සිසුන්ට එය හරහා ලබාගත හැකි දේ පිළිබඳව පැහැදිලි කිරීමක් අන්තර්ගත විය යුතුය.<br><br>ඔබගේ පාඨමාලාවේ පළමුවන කොටසේදී එහි අන්තර්ගතය තුළට ගැඹුරින් විස්තර කිරීම වඩා සුදුසු වේ.<br><br>ඔබේ පාඨමාලාවේ එක් එක් කොටස එහි ඉලක්ක ගත නිශ්චිත කුසලතා සඳහා වෙන් කළ යුතුය.<br><br>ඔබේ පාඨමාලාවේ සෑම දේශනයක්ම එක් සංකල්පයක් සඳහා වෙන් කළ යුතුය. | අවශ්‍ය<br><br>නිර්දේශිත<br><br>නිර්දේශිත<br><br>නිර්දේශිත |
| ප්‍රයෝගික ක්‍රියාකාරකම් | ඔබේ පාඨමාලාවේ සෑම කොටසක් තුළදීම එහිදී සිසුන් උගත් විෂය කරුණු යෙදවීම සඳහා එක ඉගෙනුම් ක්‍රියාවලියක් අන්තර්ගත කරන්න (ගැටලු, අභ්‍යාස,හෝ ව්‍යාපෘති).<br><br>ඔබේ පාඨමාලාවේ සෑම ප්‍රයෝගික අභ්‍යාසයක් සඳහාම අවශ්‍ය වන වැඩ පත්‍රිකා, source code, පුහුණු ගොනු ආදී සියලු සම්පත් ලබා දෙන්න. Upload කරන්න | නිර්දේශිත<br><br>නිර්දේශිත |

# නිපැයුම

| නිර්ණායක | පැහැදිලි කිරීම | වර්ගය |
|---|---|---|
| දේශන ආකෘතිය | වීඩියෝ දේශනයක දිග විනාඩි 2 ත් 20 ත් අතර විය යුතුය (යෝග, codealongs, හෝ භාවනා වැනි විශේෂිත අවස්ථාවන් හැර). | අවශ්‍ය |
| | ඔබේ සිසුන් සමඟ විශ්වාසයක් සහ මිත්‍රත්වයක් ගොඩනඟා ගැනීම සඳහා මුහුණ පෙනෙන video හැඳින්වීමක් ඇතුළත් කරන්න. | නිර්දේශිත |
| | [තාක්ෂණික නොවන පාඨමාලා සඳහා *] ඔබගේ පාඨමාලාවේ මුහුණ පෙනෙන වීඩියෝ අවම වශයෙන් 20% ක් පමණ තිබිය යුතුය. | නිර්දේශිත |
| | [තාක්ෂණික පාඨමාලා සඳහා *] ඔබේ පාඨමාලාවේ තාක්ෂණික කොටස් සඳහා screencasting මෘදුකාංග රූගත කළ යුතුය. | නිර්දේශිත |
| ශ්‍රව්‍ය (Audio) | ශ්‍රව්‍ය පට බාහිර ශබ්ද (දෝංකාර වැනි) වලින් තොර විය යුතුය. නමුත් වාහනයක නලාව වැනි ශබ්ද වරක් දෙවරක් video එක තුළ යන්තම් ඇසීම එතරම් ගැටලුවක් නොවේ. | අවශ්‍ය |
| | හඬ සහ රූප නිසියාකාරව sync වී තිබිය යුතුය. Stereo quality එක අත්‍යාවශ්‍යයි. | අවශ්‍ය |
| වීඩියෝ | පැහැදිලි ආලෝකය, රාමු සහ ස්ථාවර කැමරාවක් සහිත HD වීඩියෝ (720p අවම) රූගත කළ යුතුය. | නිර්දේශිත |
| | Slides, screencasts, හෝ වෙනත් දෘශ්‍ය අංග ඉතා තියුණු සහ පහසුවෙන් කියවිය හැකි විය යුතු ය (එනම් pixelated හෝ බොඳ නොවුණු). | අවශ්‍ය |
| | පාඨමාලාවේ දේශන වලින් අවම වශයෙන් 60% ක් වීඩියෝ/Screencast දර්ශන විය යුතුය. | අවශ්‍ය |
| | උපදේශකවරයා හෝ දේශන විෂය තිරය මත පැහැදිලිව දැකගත හැකි විය යුතුය. | අවශ්‍ය |
| | සියලුම වීඩියෝ දර්ශන SD (460p above) හෝ HD විය යුතුය. | අවශ්‍ය |
| | Lecture slides අතර ඇති effects පාඨමාලාව මුළුල්ලේ ඒකාකාරී වීම අනුමත කරමු. නමුත් ඔබට නිර්මාණශීලී වීමට අවස්ථාව තිබේ. | නිර්දේශිත |
| | 16: 9 ආකෘතියෙන් වීඩියෝ සියල්ල export / save කරන්න. | නිර්දේශිත |
| | විවිධ උපාංග හරහා ඉතා පහසුවෙන් කියවිය හැකි තරම් විශාල ප්‍රමාණයෙන් යුත් අකුරු භාවිතා කරන්න | නිර්දේශිත |
| උපදේශකවරයාගේ දායකත්වය | "umms" සහ "ahhs" කපා ඉවත් කරන්න. සිසුන්ට පැහැදිලි, සංක්ෂිප්ත සහ විශ්වාසදායක උපදේශකයෙකු අවශ්‍ය වේ. | අවශ්‍ය |
| | උද්‍යෝගීමත් ස්වරයකින් ඔබගේ අන්තර්ගතය ලබා දීමට කටයුතු කරන්න. කැමරාව මගින් රූගත කළ විට මුහුණේ හැඟීම් පෙනේවීම තරමක් දුරට අඩු වේ. එබැවින් මුහුණේ හැඟීම් ඉතා හොඳින් ප්‍රකාශ කිරීමට වගබලා ගන්න. | අවශ්‍ය |
| | ඔබේ වචන පැහැදිලිව උච්චාරණය හා වැදගත් කරුණු අවධාරණය කිරීම අවශ්‍ය වේ. | අවශ්‍ය |

| | | |
|---|---|---|
| ප්‍රවර්ධන වීඩියෝව | සිසුන්ගේ සහභාගිත්වය වැඩි කර ගැනීම සඳහා ප්‍රවර්ධන වීඩියෝවක් ඇතුළත් කරන්න.<br><br>පාඨමාලා මාතෘකාව, පාඨමාලා අරමුණු සහ ඉගැන්වීමේ විලාසය පිළිබඳ සන්දර්භය සැපයීම සඳහා ප්‍රවර්ධන වීඩියෝව උපයෝගී කර ගන්න. | නිර්දේශිත<br><br>නිර්දේශිත |

# පළ කිරීම

| නිර්ණායක | පැහැදිලි කිරීම් | වර්ගය |
|---|---|---|
| උපදේශක ජීව දත්ත | ක්ෂේත්‍රය තුළ ඔබේ පසුබිම, අත්දැකීම් සහ විශ්වසනීයත්වය අවධාරණය කිරීම සඳහා උපදේශක ජීව දත්ත භාවිතා කරන්න. | අවශ්‍ය |
| පාඨමාලා මිල | පාඨමාලා මිල තීරණය කරන්න. මෙහිදී අප ඔබට සහය වන්නෙමු.<br><br>පාඨමාලාවේ මිල සමාන මාතෘකා, අන්තර්ගතය සහ ඉගැන්වීමේ විලාසයක් යටතේ ඇති වෙනත් පාඨමාලාවල මිලට සමාන විය යුතුය. | අවශ්‍ය<br><br>නිර්දේශිත |
| මාතෘකා සහ උප මාතෘකා | ඔබගේ පාඨමාලාවේ මාතෘකාව මගින් පාඨමාලාව තුළ ආවරණය කරන දේ පිළිබඳව අදහස් විය යුතුය.<br><br>ඔබගේ උප මාතෘකා එයට පදනම් වන මාතෘකාව යටතේ පෙළගැස්විය යුතු අතර පුනරාවර්ති නොවිය යුතුයි. | අවශ්‍ය<br><br>අවශ්‍ය |
| පාඨමාලා සාරාංශය | ඔබේ පාඨමාලාව ආවරණය කරන දේ, එය උගන්වනු ලබන්නේ කෙසේද, සිසුන්ට උගත හැකි දේ සහ පාඨමාලාවේ ප්‍රතිලාභ කෙටියෙන් විස්තර කරන්න. අපගේ නිර්දේශිත හොඳම භාවිතයන් යොදාගෙන විකුණුම් පරිවර්තන සඳහා ප්‍රශස්තකරණය කරන්න. | අවශ්‍ය |
| පාඨමාලා රූපය | 16: 9 විය යුතුය; අවම වශයෙන් 2048 x 1152 pixels විය යුතුය; .jpg, .jpeg, .gif, .png, හෝ .bmp format එකක් තිබිය යුතුය. elearning.lk අපි මේ සේවාව නොමිලේ සපයා දෙමු | අවශ්‍ය |
| දේශන පිළිබඳ විස්තර | සෑම දේශනයක්ම මගින් ආවරණය වන්නේ කුමක්ද යන්න පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්න. | නිර්දේශිත |
| පාඨමාලාව සාදා නිම කිරීම | පාඨමාලාවේ දේශන 100% ක් ප්‍රකාශයට පත් කළ යුතු ය. | අවශ්‍ය |